# HDFC බැංකුව

දශක හතරක කාලයක් පුරා විවිධ මූල්‍ය විසඳුම් හරහා සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ හිසට සෙවණක් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට මූල්‍ය සහාය සපයමින් දැයේ අභිවෘද්ධිය උදෙසා කැප වන බැංකුවක් සමඟ ඔබේ බැංකුකරණ වෘත්තීය උසස් තලයකට ගෙන ඒමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

**HDFC** බැංකුවෙහි පහත සඳහන් තනතුරු සඳහා දක්ෂ, ක්‍රියාශීලී සහ සුබවාදී දැක්මක් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

උසාවි ලිපිකරු / නොතාරිස් ලිපිකරු, **ශ්‍රේණිය** VI (1)
මඩකළපුව ශාඛාව / හෝමාගම ශාඛාව (පුරප්පාඩු 02කි)

**මූලික වගකීම්:**

- නඩු කටයුතුවලට අදාළ ලිපි ලේඛණ යතුරුලියනය කිරීම.
- අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ ආයතන හා සම්බන්ධ වී හිමිකම් පරීක්ෂා කිරීම.
- අධිකරණ වෙත ගොස් අදාළ තොරතුරු සහ නඩු තොරතුරු යනාදි විස්තර ලබා ගැනීම.
- අධිකරණ, ඉඩම් ලියාපදිංචි කිරීමේ ආයතන හා වෙනත් ඕනෑම ආයතනයක් වෙත යාම සහ අවශ්‍ය අවස්ථාවල ඒවාට ලිපි ලේඛණ යොමු කිරීම.
- දත්ත කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම (DMS) .

**සුදුසුකම්:**

- අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් සාමාන්‍ය සාමාර්ථ තුනක් සමඟ (සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත් වීම.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් සාමාර්ථ හයක් සහ ගණිතය, සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි ඇතුළුව සම්මාන සාමාර්ථ පහක් සහිතව සමත් වීම.
- MS Office පිළිබඳ දැනුම තිබීම.
- සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් හොඳින් යතුරුලියනය කිරීමේ හැකියාව තිබීම.
- නීති ආයතනයක හෝ නීතිඥයෙකු යටතේ මීට සමාන තනතුරක අවම වශයෙන් වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම විශේෂ සුදුසුකමකි.

වයස **:** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30ට අඩු වීම වඩාත් සුදුසු වේ.

**තනතුර සඳහා අදාළ නියම සහ කොන්දේසි:**

මෙම තනතුර සඳහා තෝරා ගන්නා අපේක්ෂකයන් පළමුව වසර 02ක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා අතර යහපත් කාර්ය සාධනය මත පරිවාස කාල සීමාවකට යොමු කෙරෙනු ඇත.

ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 2024.06.05 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට ඉල්ලා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති පුද්ගලයන්ට මෙම තනතුර සඳහා අයදුම් කළ නොහැක. අදාළ සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්ගේ අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබුණු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලිපි ගොනුවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු හේතුවක් මත මෙම තනතුර සඳහා පත් නොකෙරෙනු ඇත.

ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් මෙම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සැළැකේ.

බඳවා ගැනීම් කල් දැමීමට හෝ අවලංගු කිරීමට HDFC බැංකුවට හැකියාවක් ඇත. තෝරා ගත් අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ ක්‍රමවේදයේ ඉදිරි අදියර සඳහා කැඳවනු ඇත.


**සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන**
**HDFC බැංකුව**
**තැ. පෙ. 2085**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත**
**කොළඹ 02**
**දුරකථන අංකය: 0112356800        වෙබ් අඩවිය: www.hdfc.lk**